**සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 12 දින විගණනයට ඉදිරිපත්කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජුනි 20 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් භුක්ති විඳින ඉඩම් කැබලි 06ක් තක්සේරුකර ගිණුම්ගතකිරීමට කටයුතුකර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාව සතු ගොඩනැගිලි 06ක වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට ලැබිය යුතු රු.153,000ක සම්ප්‍රේෂණ කුළුණු ආදායම රු.228,000ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ලැබියයුතු ආදායම් හා සමුච්චිත අරමුදල රු.75,000ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂය තුලදී ලද රු.67,619ක ස්ථාවර තැන්පත් පොලී සමුච්චිත අරමුදල හරකර ස්ථාවර තැන්පත් පොලී බැර කිරීම නිසා වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු රු.71,576ක ස්ථාවර තැන්පත් පොලී ගිණුම්ගතකර නොතිබුණි.

(ඊ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන සඳහා ඉකුත් වර්ෂයේදී ලැබුණු රු.1,000,000ක් තැන්පත් ගිණුමට බැරකර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මෙම වටිනාකම සමුච්චිත අරමුදල හරකර පොදු තැන්පත් බැරකිරීම නිසා සමුච්චිත අරමුදල රු. 2,000,000ක් අඩුවෙන් හා තැන්පත් ගිණුම රු. 2,000,000ක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වියදම් රු.120,000ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ඟ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට වැඩිපුර ගිණුම්ගතකර තිබුණු රු.187,025ක ලැබිය යුතු බැකෝලෝඩර් කුලී ආදායම නිවැරදි කිරීමේදී ආදායම් ගිණුම හර කිරීම නිසා වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේදී ඉදිකරන ලද රු.2,324,502ක් වටිනා ප්‍රාදේශීය සභා ගොඩනැගිලි සහ සවිකිරීම් ප්‍රාග්ධනිතකර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු රු.327,400ක් ගිණුම්ගතකර නොතිබුණි.

### 1.3.2 නොසැසඳුණු ගිණුම්

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන බැකෝ ලෝඩර් යන්ත්‍ර ණයගැති ශේෂය සහ බැකෝ ලෝඩර් යන්ත්‍ර ණයගැති ලේඛනයෙහි දැක්වෙන ශේෂය අතර රු.130,175ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

**ලැබිය යුතු ගිණුම්**

(i) 2014 සහ 2015 වර්ෂවල සභාව සතු බැකෝ ලෝඩරය කුලියට දීමෙන් අයවිය යුතු රු.241,975ක් සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ii) 2008-2016 කාලපරිච්ඡේදය දක්වා අයකරගතයුතු එකතුව රු.153,000ක් වූ හිඟ සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු ආදායම සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

**(අ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 178,302,188ක් වූ ගිණුම් විෂයයන් 09ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකිවිය.

**1.3.5** **<u>අනුකූල නොවීම්</u>**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 143 හා 145 | - | පොදු තැන්පත් ලේඛනය මාසිකව තුලනයකර ප්‍රධාන ලෙජරය සමඟ ගලපා නොතිබුණි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.i ඡේදය | - | සභාව සතු වාහන 9ක් සම්බන්ධයෙන් ඉන්ධන දහනය පිළිබඳව පරීක්ෂාව සිදුකර නොතිබුණි. |
| (ඇ) | ඌව පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය. | - | සභාව සතු කඩකාමර කුලී තක්සේරු කිරීමට කටයුතුකර නොතිබුණි. |
| (ඈ) | 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වගන්තිය. | - | භාවිතයට නොගන්නා වත්කම් 2015 ඔක්තෝබර් 10 දිනට පෙර අපහරණය කිරීමට කටයුතු කල යුතු වුවත්, සභාව සතු භාවිතයට නොගන්නා වාහන 7ක් සම්බන්ධව එසේ කටයුතුකර නොතිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1986 මාර්තු 10 දිනැති අංක 392/9 දරන අති විශේෂ ගැසට් පත්‍රය සහ නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 1985 මාර්තු 20 දිනැති අංක 08/01/38 දරන චක්‍රලේඛය. | - | සභා බලප්‍රදේශය තුල ඉදිකෙරෙන ගොඩනැගිලි සඳහා අනුමැතිය ලබාදීමට සැලසුම් කමිටුවක් පිහිටුවා නොතිබුණි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,577,611ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,407,618ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තු ගත ආදායම<br>රු. | 2017 බිල් කළ ආදායම<br>රු. | 2017 රැස්කළ ආදායම<br>රු. | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. | 2016 ඇස්තමේන්තු ගත ආදායම<br>රු. | 2016 බිල් කළ ආදායම<br>රු. | 2016 රැස්කළ ආදායම<br>රු. | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| (i) | වරිපනම් හා බදු | 422,000 | 467,888 | 467,888 | - | 2,000 | 1,142,245 | 1,142,245 | - |
| (ii) | කුලී | 15,332,710 | 10,000,435 | 10,000,435 | 5,332,275 | 17,239,450 | 11,708,357 | 11,708,357 | 5,531,093 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,563,000 | 1,454,630 | 1,454,630 | 108,370 | 1,553,000 | 1,438,520 | 1,438,520 | 114,480 |
| (iv) | වෙනත් ආදායම් | 46,247,112 | 44,331,460 | 44,331,460 | 1,915,651 | 50,343,872 | 44,015,792 | 44,015,792 | 6,328,079 |
| | **එකතුව** | **63,564,822** | **56,254,413** | **56,254,413** | **7356296** | **69,138,322** | **58,304,914** | **58,304,914** | **11,973,652** |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රුපියල් මිලියන 56ක් වූ මුළු ආදායම රැස්කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානවන විට රුපියල් මිලියන 7.4ක හිඟ ආදායම් පැවතුණි.

#### 2.2.3 වරිපනම් බදු

සභා බලප්‍රදේශයේ පිහිටි දියුණු ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ගගෙන සභාවේ ආදායම වැඩිකර ගැනීම සම්බන්ධයෙන් නිසි අවධානය යොමුකර නොතිබුණි.

**2.2.4 කුලී**

**කඩ කුලී**

සභාව සතු කඩකාමර 84කින් සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබියයුතු රු.128,069ක කුලී ආදායම් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

**2.2.5 බලපත්‍ර ගාස්තු**

**වෙළඳ බලපත්‍ර**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ස්ථාපිතකර ඇති දුරකථන සම්ප්‍රේෂණ කුළුණුවලින් වාර්ෂිකව බදු අයකිරීම සඳහා ප්‍රසිද්ධකර තිබුණද සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ වෙනුවෙන් එකතුව රු.171,000ක් අයකරගෙන නොතිබුණි.

**2.2.6 වෙනත් ආදායම්**

(අ) බැකෝලෝඩර් යන්ත්‍ර කුලියට දීමෙන් සමාලෝචිත වර්ෂයේ ලැබියයුතු රු.274,425ක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) සභා බලප්‍රදේශයේ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකිරීමට ප්‍රසිද්ධකර තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂයේදී දැන්වීම් පුවරු 114ක් සඳහා රු.327,400ක ගාස්තු අයකිරීමට කටයුතුකර නොතිබුණි.

**2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.168,600 හා මුද්දර ගාස්තු රු. 2,265,919ක් විය.

**2.3 අධිභාර**

ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂයන් තුල පැනවූ අධිභාර වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට රු.582,567ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දිනවන විටත් කාරණා 23ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කර්තව්‍යයන් තීරණයකර තිබුණද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර නොතිබුණි.

(ඇ) <u>ඝනඅපද්‍රව්‍ය කළමනාකරණය</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1816/43 දරන 2013 ජුනි 28 දින ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කරන ලද ඌව පළාත් සභා අතුරු ව්‍යවස්ථාව වැලඳ ගැනීමට කටයුතුකර තිබුණද, එහි 13 වන කොටසේ 2 වන වගන්තිය ප්‍රකාර කසළ බදු පනවා සමාලෝචිත වර්ෂයේදී දරා තිබුණු කසළ කළමනාකරණ වියදම පියවාගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඈ) <u>තිරසාර සංවර්ධන ඉලක්ක</u>

තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහාවන ගෝලීය දර්ශක තුලින් සභා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහාවන දිගුකාලීන සැලසුම් 2018 මැයි 25 දින වනවිටත් සකස්කර නොතිබුණි.

**3.2** <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

<u>හානි හා පාඩු අයකර නොගැනීම</u>

සභාව සතු බැකෝලෝඩර් යන්ත්‍රය අනතුරකට ලක්වී එය අළුත්වැඩියා කිරීමට ගෙවා තිබුණු රු.58,000ක් රක්ෂණයෙන් ප්‍රතිපූර්ණයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

**3.3** <u>මානව සම්පත් කළමනාකරණය</u>

වර්ෂ ගණනාවක සිට අය නොවී පවතින දැනට සේවයේ නියුක්තව නොමැති සේවකයින් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.35,329ක සේවක ණය අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

**3.4** <u>වත්කම් කළමනාකරණය</u>

සුසානභූමි 34ක් පවරාගැනීමට කටයුතුකර නොතිබුණි.

**3.5 ආර්ථික නොවූ ගනුදෙනු**

වාහන සේවා ඒකකයක් ඉදිකිරීම සඳහා 2014 වර්ෂයේදී රු.1,164,604ක් වැයකර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානවන විටත් එය අපේක්ෂිත කාර්යය සඳහා යොදවා නොතිබුණු නිසා දරන ලද වියදම අනාර්ථික වියදමක් බවට පත්වී තිබුණි.

**3.6 ප්‍රසම්පාදනය**

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

**3.6.2 වාර්ෂික දේපළ ටෙන්ඩර් කිරීම**

සභාව විසින් ප්‍රසම්පාදන දැන්වීම් එලකිරීමේදී සැපයුම්කරුවන් සීමාකිරීමට කොන්දේසි ඇතුලත්කර ජාතික තරඟකාරී මිල කැඳවීම් සිදුකර තිබුණි.

**04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රාදේශීය සභාවේ අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස උපයෝගීකරගෙන නොතිබුණි.

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ විගණන හා කළමනාකරණ කමිටු ප්‍රමාණවත් පරිදි පැවැත්වීමට කටයුතුකර නොතිබුණි.

**05. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | (i) | ඉඩම් හා ගොඩනැගිලි ගිණුම්ගත නොකිරීම |
| | (ii) | සමාලෝචිත වර්ෂයේ මිලදීගත් ස්ථාවර වත්කම් ගිණුම්ගත නොකිරීම |
| | (iii) | උපචිත වියදම් ගිණුම්ගත නොකිරීම |
| | (iv) | ලැබිය යුතු ආදායම් ගිණුම්ගත නොකිරීම |

(v) ගිණුම් ශේෂ වරදවා දැක්වීම

(ආ) වත්කම්/දේපල

(i) ලේඛනගත නොකිරීම

(ii) ඉඩම් පවරා ගැනීමට කටයුතු නොකිරීම